# හෙරොයින්






ශ්‍රියාණි මද්දුමගේ

පසුගිය සතියේ මහත් ආන්දෝලනයට ලක් වූ කරුණක් වූයේ හෙරොයින් ප්‍රවාහණය කිරීමේ වරදට සිය ජීවිතයෙන් වන්දි ගෙවීමට සිදු වූ ඔස්ට්‍රේලියානු ජාතික නුයැන් ගේ ඉරණම විසඳුන ආකාරයයි. වසර 24 ක නව රයොවුන් තරුණයෙකු වූ නුයැං ට වසර 21 දී තමන් විසින් කරන්නට යෙදුණු වරදේ බරපතල කම පිළිබඳව අවබෝධයක් නොතිබුණා විය හැකි ය. මත් ද්‍රව්‍ය ප්‍රවාහණය නිෂ්පාදනය තමන් සන්තකයේ තබා ගැනීම වැනි ක්‍රියා සඳහා ලෝකයේ රටවල් මෙතරම් බරපතල දඬුවම් ලබා දීමට පියවර ගන්නේ මන්ද යන්න පිළිබඳව දැනුවත් වීම බෙහෙවින් වැදගත් වන්නේ අපේ දූ දරුවන් මෙවන් ව්‍යසනයන්ගෙන් මුදවා ගැනීම වැඩිහිටියන් සතු වගකීමක් වන බැවිනි.
හෙරොයින් යනු කුමක් ද සහ හෙරොයින් ප්‍රවාහණය මෙතරම් බරපතල වරදක් ලෙස සැළකීමට හේතු වන කරුණු මොනවාද යන්න පිළිබඳව විමසා බැලීම මෙම ලිපියේ අරමුණයි.

### හෙරොයින් යනු කුමක් ද?

හෙරොයින් අයත් වන්නේ ඕපියේට්ස් නමැති මත්ද්‍රව්‍ය ගනයටයි. මේ ගනයේ මත්ද්‍රව්‍ය මගින් සිරුරේ මධ්‍ය ස්නායු පද්ධතියේ ක්‍රියාකාරීත්වය මන්ගාමී කොට මොළයට හා මොළයේ යට අවයව කරා පණිවිඩ ගෙනයාම අඩාල කරවයි.

හෙරොයින් නිපදවන්නන් ආසියාවේ හා මැදපෙරදිග වැවෙන ඕපියම් ශාඛයේ පො-හොට්ටු වලින් ලබා ගන්නා ද්‍රව්‍යයකි. වෛද්‍ය විද්‍යාවේ දී ප්‍රයෝජනයට ගන්නා මෝෆීන් ද ලබා ගන්නේ මේ මගිනි. සැබැවින් ම අතීතයේදී මෙය සාදාගන්නා ගද්දේ බෙහෙතක් ලෙසය. හෙරොයින් සුදු පාටට හුරු කැබලි වශයෙන් පවතින තිත්ත රසයෙන් යුත් ද්‍රව්‍යයකි.

### හෙරොයින් වලින් සිරුරට ඇති වන අහිතකර බලපෑම් මොනවාද?

ඕනෑම මත් ද්‍රව්‍යයක බලපෑම පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වෙයි. එම බලපෑම පුද්ගලයාගේ බර සෞඛ්‍ය තත්වය පරිසරය වැනි කරුණු මත වෙනස් විය හැකි ය. හෙරොයින් වල ආසන්නතම බලපෑම වන්නේ වේදනාව තුරන් වුවත් දැනීම හුස්ම ගැනීම, රුධිර පීඩනය, සහ හති වැටීම සෙමින් සිදුවීම, නිදි මත ගතිය සහ වමනය ඇති වීම යනාදියයි. හෙරොයින් අධික ප්‍රමාණ වලින් ගත් විට සම, හෘදය හා පෙනහළු වල ආසාදන මෙන්ම හෙපටයිටිස් හා එච්අයි වී වැනි රෝග පවා වැළඳිය හැකි ය. හෙරොයින් අධික ලෙස ගැනීමෙන් හුස්ම ගැනීම ඉතා සෙමින් සිදුවී නාඩි වැටීම අඩු වී මරණය පවා සිදුවිය හැකිය.

### හෙරොයින් ආශ්‍රිත මරණ පිළිබඳ නවතම වාර්තා කවරේ ද?

මත්ද්‍රව්‍ය නිසා සිදුවන මරණ වලින් 62% ක් පමණ ම හෙරොයින් ආශ්‍රිත මරණ බව සංඛ්‍යාලේඛණ පෙන්වා දෙයි. ව්‍යවහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳ වික්ටෝරියානු ආයතනයේ නවතම වාර්තා වලට අනුව 1991 සිට 2004 දක්වා කාලය තුළ හෙරොයින් නිසා සිදුවූ මරණ සංඛ්‍යාව 2033 කි. 1991 වසරේ වික්ටෝරියා ප්‍රාන්තයේ හෙරොයින් නිසා සිදුවූ මරණ සංඛ්‍යාව 46 ක් වූ අතර එය වසරින් වසර වර්ධනයට ලක්ව 1999 දී 359 ක් දක්වා ඉහළ නැගී අතර 2000 දී 331 ක් විය. 2001 දී මරණ සංඛ්‍යාව සැළකිය යුතු ලෙස අඩුව ඇති නමුත් එය දෙගුණයකටත් වඩා වැඩි වේගයකින් වර්ධනය වී 2004 වන විට 120 දක්වා වර්ධනය වී ඇත.
1991 - 2004 දක්වා කාලය තුළ හෙරොයින් නිසා මරුමුවට පත්වූවන්ගෙන් 50% ක්ම විරැකියාවෙන් පෙළුනන් වූ අතර රැකියා කරන්නන්ගේ ප්‍රතිශතය 26% ක් විශ්‍රාම ලැබූවන් 14% ක්ද සිසුන් 19%ක්ද වූ බව වාර්තා වෙයි. විකටෝරියා ප5ාන්තයේ හෙරොයින් නිසා සිදුවූ මරණ වැඩි වශයෙන් වාර්තා වී ඇත්තේ මෙල්බන් සෙන්ට් කිල්ඩා, ෆුට්ස්ක්‍රේ, ඩැන්ඩිනොන්, ෆිට්ස්රෝයි යන ප්‍රදේශ වලය.

### හෙරොයින් නිසා ඇතිව සමාජ බලපෑම කවරේද?

හෙරොයින් භාවිතා කරන්නවුන්ට ඉන් සිදුවන පුද්ගලික හානියට අමතරව මෙම භයානක මත්ද්‍රව්‍යය හේතුවෙන් සමස්ත සමාජයට සිදුවන අහිතකර බලපෑම් බොහෝ ය. හෙරොයින් වලට ඇබ්බැහිවූවන් විසින් කෙරෙන සොරකම් මංකොල්ලකෑම් ස්ත්‍රී දූෂණ සහ මිනී මැරීම් යන සමාජ විරෝධී ක්‍රියා අද සෑම රටකටම මුහුණ දීමට සිදුව ඇති විශාල ප්‍රශ්ණයකි. සමාජයේ ජීවත් වන යහපත් අවිහිංසාවාදී පුද්ගලයන් මතට ඇබ්බැහි වූ පුද්ගලයන්ගේ සමාජ විරෝධී ක්‍රියාවන්ගෙන් බේරා ගැනීම සෑම රජයක්ම සතු විශාල වගකීමක් බවට අද පත්ව තිබේ. මතට ඇබ්බැහිවූවන් ඉන් මුදවා ගැනීම සඳහා තිබෙන පුනරුත්ථාපන වැඩ සටහන් සඳහා සෑම රජයක්ම විශාල බවශයෙන් මුදල් වැය කරයි. හෙරොයින් ප්‍රවාහනය පිළිබඳ දැඩි දඬුවම් පැමිණවීම ලෝකයේ බොහෝ රටවල් පියවර ගෙන ඇත්තේ මෙම මත්ද්‍රව්‍ය මගින් එම පුද්ගලයාට මෙන්ම සමස්ත සමාජයටම මේ සා විශාල හානියක් සිදුවන නිසා බව අප අමතක නොකළ යුතුය.

### හෙරොයින් නිෂාපාදනයේ අඩු වැඩි වීම අන් රටවලට බලපාන්නේ කෙසේද?

එක්සත් ජාතීන්ගේ වාර්තා වලට අනුව ලෝකයේ වත්මන් පොපි න්ෂ්පාදනය හෙක්ටෙයාර් 170,000 ක් පමණි. 1996 දී ඇෆ්ඝනිස්ථාන් තලේබාන් පාලනය විසින් පොපි නිෂ්පාදනය ඉහළ නැංවූ අතර ඇෆ්ඝනිස්ථානය ලෝකයේ විහාලතම පොපි නිෂ්පාදකයා බවට පත් විය. මෙම වසරේ වික්ටෝරියා ප්‍රාන්තයේ හෙරොයින් ආශ්‍රිත මරණ සංඛ්‍යාව වාර්තාගත මට්ටමකට ඉහළ නැග ඇත. 2000 වසරේ දී තලේබාන් ආන්ඩුව පොපි නිස්පාදනය තහනම් කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස එම රටේ හෙරොයින් සැපයුම සැළකිය යුතු ලෙස අඩු විය. 2000 වසරේ දී වික්ටෝරියා ප්‍රාන්තයේ හෙරොයින් ආශ්‍රිත. මරණ සංඛ්‍යාව අඩු වීමට එය එක් හේතුවක් විය හැකි ය. නැවත එම රටේ හෙරොයින් නිෂ්පාදනය වර්ධනය වෙමින් පවතින අතර ඊට සාපේක්ෂව මරණ සංඛ්‍යාවේද වැඩි වීමක් පෙන්නුම් කරයි. මේ අනුව පෙනී යනනේ හෙරොයින් නිස්පාදනය පිළිබඳව ලෝකයේ රටවල් කෙතරම් දැඩි පිළිවෙත් හා නීති රීති අනුගමනය කළත් එම නීති රීති නොසළකා හෙරොයින් ප්‍රවාහනය කරන්නවුන් අඩුවක් නොමැතිව එය කර5න බවයි.

එක්සත් ජාතීන්ගේ වාර්තා වලට අනුව ලෝකයේ වත්මන් පොපි නිෂ්පාදනය හෙක්ටෙයාර් 170,000 ක් පමණි. 1996 දී ඇෆ්ඝනිස්ථාන් තලේබාන් පාලනය විසින් පොපි නිෂ්පාදනය ඉහළ නැංවූ අතර ඇෆ්ඝනිස්ථානය ලෝකයේ විහාලතම පොපි නිෂ්පාදකයා බවට පත් විය.

### හෙරොයින් ප්‍රවාහනයට අදාල වික්ටෝරියා නීතිය කුමක් ද?

හෙරොයින් සන්තකයේ තබා ගැනීම , නිෂ්පාදනය කිරීම හා වෙළඳාම සඳහා ප්‍රවාහනය කිරීමට අදාලව ඔස්ට්‍රේලියානු ෆෙඩරල් හා ප්‍රාන්ත රාජ්‍ය මගින් නීති පනවුනු ලැබ ඇත. වික්ටෝරියා ප්‍රාන්තයේ ඇති නීතියට අනුව හෙරොයි-න් වගා කිරීම ඩොලර් 2000 - 3000 අතර දඩයක් හෝ වසරක සිර දඬුවමකට යටත් කළ හැකි ය. ■

හෙරොයින් වෙළඳාම සඳහා ප්‍රවාහණය කිරීම බරපතල වරදක් ලෙස මෙහිදී සළකනු ලබන අතර ඊට හිමිවන දඬුවම වන්නේ ඩොලර් 250000 දක්වා වූ දඩයක් හා වසර 25 ක සිර දඬුවමකි. ශ්‍රී ලංකාවේ හෙරොයින් විශාල ප්‍රමාණයක් ප්‍රවාහණය කිරීම මරණ දඬුවම නියම කළ හිකි වරදක් ය. එනමුත් මරණ දඬුවම ක්‍රියාත්මක නොවන බැවින් ඔවුන් ජීවිතාන්තය දක්වා සිර දඬුවමකට නියම වෙයි. නුයැං ට මරණ දඬුවම ලාබදීම සාධාරණීකරණය දීම හෝ නොදීම සාධාරණී කරණය කිරීම මේ ලිපියේ අරමුණ නොවුවත් ඔහු විසින් කරන ලද වරදේ බරපතල කම පිළිබඳව නැවත සිතා බලන්නට තොරතුරු ඉවහල් වනු ඇත.
තරුණ තරුණියන් මත් ද්‍රව්‍ය වලට යොමු වනනේ එක් වරක් හෝ අත්හදා බැලීමට යාමෙනි. තවද හෙරොයින් වලට ඇබ්බැහි වුවන්ගේ යොමු කිරීම නිසාත් ඔවුහු මත් ද්‍රව්‍ය වලට යෝමු වෙති. වාර්තකා වලට අනුව හෙරොයින් වලට ඇබ්බැහිවූවන්ගේ පළමු මතද්‍රව්‍ය ය වී ඇත්තේ දුම්පානයයි.ත ඔබ අප ජීවත් වන මේ සමාජයේ දුම් පානය ඉතා භයානක වෙදයකි. එහෙත් භයානක මත්ද්‍රව්‍යයන්ට අපේ අත්පොත් තබන දුම්පානයෙන් තම දරුවන් වළක්වා ගැනීම පිළිබඳව දෙමාපියන් මූලික වශයෙන් තම අවධානය යොමු කළ යුතු ය. තම දරුවා යහපත් පුරවැසියෙකු ලෙස සමාජයට එක්කිරීමේ වගකීම දෙමාපියන් සතු වන බව අප අමතක කළ යුතු නැත.